# 1. අල් ඊමාන්

## 1.1 ඊමාන් සහ අමල්

* ඊමාන් සිත හා බැඳුනු එකකි.
* ඊමාන් සහ අමල් වෙන් කළ නොහැකි කරුණු වේ.
* ඊමාන් යහපත් ගුණ දහම් වර්ධනය කරයි.
* ඊමාන් අල්ලාහ් සමග සම්බන්ධකම ස්ථිර කරයි.

ඊමාන් යනු කෙනෙක් "අෂ්හදු අන් ලා ඉලාහ ඉල්ලල්ලාහු වඅෂ්හදු අන්න මුහම්මදර් රසූලුල්ලාහි" නම් වදන් මුවින් පවසා, ඒවා සිතින් ස්ථිරව පිළිගෙන සිරුරේ අවයව වලින් ක්‍රියාත්මක කිරීම බව අහ්ලුස් සුන්නත් වල්ජමා අත්හි ප්‍රතිපත්තියයි.

අමල් යනු ඊමාන් තැබුවන් චිත්ත පාරිශුද්ධියෙන් ඉටු කරන සලාතය, සව්ම්, zසකාත්, හජ්, අල්කුර්ආනය පාරායනය කිරීම, දික්ර්, කුර්බාන් භාරයන් යනාදි ක්‍රියාවන් වේ. ඊමාන් සහ අමල් යන මෙම කරුණු දෙක ම අල්ලාහ් විසින් ගැත්තන්ට ප්‍රදානය කර ඇති අනර්ඝතම වස්තූන් වේ.

ඊමාන් සහ අමල් එක් ව ලබා සිටින්නෝ මහා භාග්‍ය ලැබූවෝ ය. මොවුන්ගේ උසස් පරලොව ජීවිතය ගැන අල්ලාහ් අල්කුර්ආනයේ බොහෝ තැන්වල විවිධාකාරව වර්ණනාකර පවසා ඇත.

" إِنَّ الَّذِينَ آمَنُوا وَعَمِلُوا الصَّالِحَاتِ يَهْدِيهِمْ رَبُّهُمْ بِإِيمَانِهِمْ تَجْرِي مِنْ تَحْتِهِمُ الْأَنْهَارُ فِي جَنَّاتِ النَّعِيمِ "

" නියත වශයෙන් ම යමෙක් විශ්වාසය තබා සත් ක්‍රියාවන් කරන්නෝ ද ඔවුන්ට ඔවුන්ගේ පරමාධිපතියා ඔවුන් විශ්වාසය තැබීම හේතුකොට ගෙන යහ මග පෙන්වයි. ආනන්ද ජනක ස්වර්ගවල ඔවුන්ට පහළින් ගංගාවෝ ගලා බසිති." (10:9)

ඊමානය මුවින් ප්‍රකාශ කිරීමට පමණක් සීමා නොවේ. එය හදවත් සමග තද බැඳීමක් ඇති කරුණකි. ගම්බද ප්‍රදේශයකින් පැමිණි ඇතැම් නබි හිතවත්තු රසූල් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් වෙත පැමිණ " අපි ඊමාන් තබා ඇත්තෙමු" යනුවෙන් පැවසූහ. එවිට අල්ලාහ් ඔවුන්ගේ ඊමාන් ප්‍රමාණවත් ලෙස සිත තුළ කිඳා බැස නොමැති නිසා ද තවත් බොහෝ කරුණු ඔවුන් විසින් ගැඹුරින් ග්‍රහණය කළ යුතු ව තිබූ නිසා ද "ඊමාන් තැබුවෙමු" යනුවෙන් කියනවට වඩා "ඉස්ලාම් වූයෙමු" යනුවෙන් කීම සුදුසු බව පැහැදිලි කිරීමට පහත සඳහන් අල්කුර්ආන් වැකිය පහළ කෙළේ ය.

" قَالَتِ الْأَعْرَابُ آمَنَّا قُلْ لَمْ تُؤْمِنُوا وَلَكِنْ قُولُوا أَسْلَمْنَا وَلَمَّا يَدْخُلِ الْإِيمَانُ فِي قُلُوبِكُمْ "

" අපි ඊමාන් තැබුවෙමු". යැයි (නබි වරයාණෙනි ඔබට) ගම්බද අරාබිවරු කියති. ඔබලා ඊමාන් තැබුවේ නැහැ. එනමුත් "අපි යටහත් වූයෙමු (ඉස්ලාම් වැළඳ ගතිමු) යනුවෙන් (නම්) කියා ගන්න යැයි (නබිවරයාණෙනි, ඔවුන්ට ) කියන්න. මන්ද ඔබලාගේ සිත්වල (සැබෑ) ඊමාන් පිවිසී නැත." (49:14)

මෙම වැකිය මගින් අල්ලාහ්,මිනිසුන් අතර මුවින් පමණක් ඊමාන් පවසන ජනතාවට, අල්ලාහ්ට සමීප වීමේ සැබෑ ඊමානය හඳුන්වා දී ඇත.

අල්ලාහ් විසින් හඳුන්වා දෙන ලද මෙම ඊමානය මිනිසුන් අතර අමල් කිරීමේ උනන්දුවක් ඇති කරයි. මෙවැන්නෝ, ඊමානය සහ අමලය අල්කුර්ආනය සම්බන්ධ කොට ඇති ආකාරයට අනුව තම එදිනෙද ජීවිතයේ දී බද්ධ කර ගනිති. මොවුන් ගැන අල්ලාහ් මෙසේ පවසයි.

" إِلاَّ الَّذِيْنَ آمَنُوْا وَعَمِلُوْا الصَّالِحَاتِ "

" විශ්වාසය තබා සාලිහ්වු (යහ) අමල් කළ අය හැර (ඔවුන්ට අලාභයක් නැත.)" (103:3)

ඊමානය සහ අමලය සම්බන්ධ කොට රසූල් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් ද බොහෝ තැන්වල පවසා ඇත. උදාහරණ වශයෙන් අබ්දු ගෛස් ගෝත්‍රයට අයත් ඇතැමුන් ගමනක් ගොස් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් වෙත පැමිණ " අල්ලාහ්ගේ නබිවරයාණෙනි, සැබවින් ම අපි රබීආ ගෝත්‍රයට අයත් වෙමු. අප හා ඔබ අතර මුළර් (ගෝත්‍රයට අයත් ) කාෆිර්වරු සිටිති. ශුද්ධ වූ මාසයන් හිවත් ඔබ වෙත පැමිණීමට අපට හැකියාවක් නොමැත. අපට අණ කිහිපයක් නිකුත් කරන්න. අපෙන් ඔබ්බට සිටින්නන්හට එම අණ ඉටු කරන ලෙසට අණ කරන්නෙමු. ඒ අනුව ක්‍රියාකර එමගින් ස්වර්ගයට ද අපි පිවිසෙන්නෙමු "යි කීහ. එයට නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ " ඔබලාට (කරුණු) හතරක් (කිරීමට) අණ කරන්නෙමි" යැයි පහත සඳහන් කරුණු පැවසූහ.

01. අල්ලාහ්ට (පමණක්) නමදින්න. ඔහුට කිසිවක් හවුල් නොකරන්න.
02. සලාතය තහවුරු කරන්න.
03. zසකාත් ගෙවන්න.
04. රමළාන් (මාසයෙ) හි සව්ම් සමාදන් වන්න." (සහීහුල් මුස්ලිම්)

මෙයින් ඊමාන් හා අමල් යන දෙක ම එකිනෙක බෙද වෙන් කළ නොහැකි බව දැන ගතිමු.

ඊමානයට විශ්වාසිකයෙකු තුළ යහගුණ ද සාරධර්ම ද ඇති කරවන හැකියාවක් ඇත. ඔවුන් තුළ දක්නට ලැබෙන ඊමානිය ගතිගුණ ඔවුහු උසස් තත්ත්වය කරා ගෙන යති.

**අල්කුර්ආන් විසින් හඳුන්වා දෙනු ලබන ඊමානිය ගතිලක්ෂණ.**

* අනවශ්‍ය කථාවෙන් හා ක්‍රියාවෙන් බැහැර වීම.
* නොකඩවා zසකාත් ගෙවමින් සිටීම.
* තම රහස් අවයව (වැරදි ලෙස පාවිච්චි කිරීමෙන් ) ආරක්ෂා කර ගැනීම.

**නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමන් විසින් හඳුන්වා දෙන ලද ඊමානිය ගති ලක්ෂණ.**

* **ලජ්ජාව :**

"ඊමාන් නම් දේව විශ්වාසයේ හැත්තෑවකටත් අධික ශාඛා ඇත. ලජ්ජාව ඊමාන් ඊමානයේ ශාඛාවකි."

* **සංග්‍රහ කිරීම:**

" ඉස්ලාමයේ හොඳ ම දෙය (කුස ගින්නෙන් සිටින අයට ) ආහාර සැපයීම සහ ඔබ හඳුනන අයටත් නොහඳුනන අයටත් සලාම් කීමත් ය"

* **නබි තුමාණෝ කෙරෙහි සැබෑ ආදරය:**

මාගේ ප්‍රාණය කා සතුව ඇත්තේ ද ඔහු මත දිවුරමි, ඔබ අතරින් කෙනෙකු ඔහුගේ පියා සහ ඔහුගේ දරුවන්ට වඩා මා කෙරෙහි අධික ආදරයක් දක්වන්නෙකු වන තෙක් ඔහු ඊමාන් නම් දේව විශ්වාසයෙන් අසම්පූර්ණ කෙනෙක් වන්නේ ය.

* **අල්ලාහ්ට සහ රසූල්වරයාට ප්‍රේම කිරීම:**

යමෙකු සතුව සුදුසුකම් තුනක් ඇත්නම් ඔහු ඊමානයේ රසය අවබෝධ කරගත් කෙනෙකු වේ. (ඒවා)

කෙනෙකුට අල්ලාහ් හා ඔහුගේ දූතයා සෙසු දෙයකට වඩා අධික ප්‍රියමනාප බවට පත්වීම.
කෙනෙක් තවත් කෙනෙකුට අල්ලාහ් වෙනුවෙන් ම ප්‍රේම කිරීම.
ගින්නට විසි කිරීම පිළිකුල් කරන සේම දේව ප්‍රතික්ෂේප කිරීම ද පිළිකුල් කිරීම.

* **මහා පාපකර්ම වලින් වැළකී සිටීම:**

අල්ලාහ්ට හවුල් නොකිරීමටත් , සොරකම් නොකිරීමටත්, දුරාචාරයේ නොයෙදීමටත්, ඔබේ දරුවන් ඝාතනය නොකිරීමටත්, වර්තමානයේ දී ද අනාගතයේ දී ද (කිසිවෙකු වෙත) අපවාද නොනැගීමටත්, ඕනෑම යහපත්

කාර්යයක දී (මට) පිටුපා නොසිටීමටත් මා සමග ගිවිසුමක් කරගන්න. ඔබ අතරින් (ඒවා) ඉටු කරන්නන් ගේ ආනිසංස අල්ලාහ් සතුව ඇත. ඉහත පවසන ලද (අපරාධ) කිසිවක්, කෙනෙකු විසින් කරනු ලැබ (ඒ සඳහා) මෙලොව දී දඬුවමට භාජනය වේ නම් එය ඔහුට ප්‍රතිකර්මයක් වේවි. ඉහත පවසන ලද කිසිවක් කෙනෙක් කළ පසුව අල්ලාහ් එය (කිසිවකු නොදන්නා ආකාරයට) වසං කළා නම් ඔහු අල්ලාහ් ගේ භාරයේ සිටියි. ඔහු කැමති නම් ඔහුට කමාව දෙයි. ඔහු කැමති නම් ඔහුට දඬුවම් කරයි.

මුඃමින්වරයෙක් කවදත් කොයි මොහොතේ දීත් අල්ලාහ් සමග සම්බන්ධතා සුරකියි. මන්ද යත් එම සම්බන්ධතා මගින් ඔහු මෙලොවදීත් පරලොවදීත් සැනසීමක් ලබයි. ඔහු සමග කුලුපග වීමට ඇති සාධක අතර සජ්දවත් එකකි. ගැත්තෙක් සජ්දවෙහි සිටින මොහොතේ දී ඔහු අල්ලාහ් සමග ඉතා කිට්ටුවෙන් සිටියි.

"එසේ (ඔහු කියන පරිදි) නොවේ. ඔහුට අවනත නොවන්න. (ඔබගේ දෙවියාට) සුජූද් කර (නමැද ඔහු සමග) සමීප වෙන්න". (96:19)

අල්ලාහ් සමග බැඳීම් ස්ථිර කිරීමටත් ආරක්ෂා කිරීමටත් පහත සඳහන් කරුණු උපකාරී වේ.

* අල්ලාහ් ගේ මාර්ගයෙහි ජනතාව කැඳවීම.
* ෆර්ල්/සුන්නත් වන සලාතයන් ඉටු කිරීම.
* මැදියම් රෑ සලාතය වැනි සුන්නත් වන සලාත්වල නිරත වීම.
* ෆර්ල්/ සුන්නත් සව්ම් ඉටු කිරීම.
* zසකාත්, සදකා හා වෙනත් පරිත්‍යාගයන් කිරීම.
* අල්කුර්ආන් පාරායනය කිරීම හා අල්ලාහ්ව දික්ර් කිරීම.
* අල්ලාහ්ගේ මැවීම් පිළිබඳව පර්යේෂණ පැවැත්වීම.
* ඊමානිය සභාවලට සහභාගී වීම.
* සාමූහික වගකීම් සාමූහිකව ඉටු කිරීම.
* ආලිම්වරුන්, දෙමාපියන් හා ගුරුවරුන් ගේ උපදෙස් පිළිගෙන ක්‍රියා කිරීම.
* යහපත් මිත්‍රයින් සමග ඇසුරු කිරීම.
* හොඳ පොත් පත් හා සඟරා කියවීම යනාදිය.

## අල්ලාහ් වෙත සමීප වීම නැති කරණ කරුණු :

අල්ලාහ් වෙත සමීපවීම හා ඔහුගේ ආදරයට පාත්‍ර වීම ඇති කරන ඉහත කරුණු වගේ ම ඒවා කෙරෙහි බලපෑම් ඇති කරන කරුණු ද ඇත. ඒවා මගින් මිනිසා අල්ලාහ් ගේ රැකවරණයෙන් ඈත් වී ෂෛතාන් ගේ කුමන්ත්‍රණවල පැටලී අලාභයට පත් වේ. ඒවා පහත දැක්වේ.

* පාප කර්මවල නියැලීම.
* දෙමාපියන් රිද්දවීම.
* ෆර්ල් වන හා සුන්නත් වන සලාත් ඉටු නොකිරීම.
* අල්කුර්ආනය පාරායනය කිරීම, තේරුම් ගැනීම, දික්ර් කිරීම යනාදිය නොසලකා හැරීම.
* ආලිම්වරුන්, දෙමව්පියන් හා ගුරුවරුන් ගේ උපදෙස් නොසලකා හැරීම හා ඔවුන්ට අවමන් කිරීම.
* නරක මිතුරන් ඇසුරු කිරීම.
* අශෝභන හෝ අසභ්‍ය චිත්‍රපටි, නාට්‍ය නැරඹීම.
* ස්ත්‍රී, පුරුෂ අයථා සම්බන්ධතා හා ඇසුරු කිරීම්.
* අශීලාචාර ඇඳුම් ඇඳීම යනාදිය.
* ලෞකික ආශාවන්හි ගිලී සිටීම.
* පොදු දේපල අයථා භාවිතය
* රැවටීම හා වංචාවන්හි යෙදීම

### ක්‍රියාකාරකම්

01. ඊමානය සහ අමල් සම්බන්ධකර පවසන ලද අල්කුර්ආන් වැකි තුනක් කියන්න.

02. අල්ලාහ් සමග බැඳීම් ස්ථීර කරන කරුණු සඳහන් කරන්න.

03. නරක යහළුවන් ඇසුරු කිරීමෙන් ඇතිවන බලපෑම හඳුනාගන්න.

## 1:2 අවසාන නබිත්වය

### ඉස්ලාම්හි නබිත්වය සහ දූත මෙහෙවර

* නබිත්වය සහ දූත මෙහෙවර පිළිගැනීම ඉස්ලාම්හි පදනම වේ.
* සියලුම නබිවරුන් හා රසූල්වරුන් අතර වෙනස්කම් නොපා ඊමාන් තැබිය යුතු ය.
* මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ අවසාන නබිවරයා ය.
* අනාවැකි පළ කරන ලද ව්‍යාජ නබිත්ව අභියෝග.
* ව්‍යාජ නබිත්වය වෙනුවෙන් පෙනී සිටි අය.

ඉස්ලාම් හි නබිත්වය (නුබුව්වත්) යනු අල්ලාහ් විසින් සිය කැමැත්තට අනුව තෝරාගනු ලබන ස්වාධීන තැනැත්තෙකුට ජිබ්රීල් අලෛහිස් සලාම් තුමන් මගින් වහී දන්වනු ලැබීමයි. මෙසේ වහී දන්වනු ලබන්නෝ නබිවරුන් යනුවෙන් හඳුන්වති.

දූත මෙහෙවර (රිසාලත්) යනු අල්ලාහ් විසින් තෝරා එවන ලද නබිවරයෙකුට ජිබ්රීල් අලෛහිස් සලාම් තුමන් මගින් වහී දන්වා එම වහී මගින් දන්වනු ලබන ෂරිආවේ අණ ජනතාවට ප්‍රචාරය කරන ලෙසට අල්ලාහ් විසින් පවරනු ලැබීමයි. එසේ පවරනු ලැබුවෝ රසූල්වරුන් (දූතයින්) වශයෙන් හඳුන්වති.

මෙම උසස් තනතුර හා වගකීම අල්ලාහ් විසින් තෝරාගනු ලබන ඔහුගේ නිර්මල යහගැත්තෝ ලබා ගනිති. එම තනතුර මිනිස් හැකියාවන් , තානාන්තර , උත්සාහය නිසා ලබා ගත නොහැකියි. රසූල්වරුන් සියල්ලෝම නබිවරුය. එහෙත් නබිවරුන් සියල්ලන් ම රසූල්වරු නොවෙති. රසූල්වරයෙකුට උදාහරණ වශයෙන් මූසා අලෛහිස් සලාම් තුමන්ව සඳහන් කළ හැකි ය. මෙතුමන් ගැන අල්ලාහ් මෙසේ පවසයි.

" وَاذْكُرْ فِي الْكِتَابِ مُوسَى إِنَّهُ كَانَ مُخْلَصًا وَكَانَ رَسُولًا نَبِيًّا "

"(නබිවරයාණෙනි), මෙම ආගමේ මූසා ගැනත් සිහිපත් කරන්න. නියත වශයෙන් ම ඔහු ශුද්ධවන්තයෙක් වීය. ඔහු රසූල්වරයෙකු ද නබිවරයෙකු ද විය. " (19:51)

ඉස්ලාම් හි ඉතා වැදගත් න්‍යායවලින් එකක් වනුයේ නබිවරුන් හා රසූල්වරුන් පිළිගෙන ඔවුන් ජීවත් වූ මාර්ගයෙහි අප ද ජීවත්වීමයි. ඉස්ලාමීය ප්‍රතිපත්තියේ අල්ලාහ් විශ්වාස කිරීම වගේ ම රසූල්වරුන් ඊමාන් කිරීමත් පදනමකි. එසේම ඔවුන් ගැන දැනුවත් වී සිටීම ද යුතුකමක් හැටියට සැලකේ.

තවද අල්ලාහ් විසින් අවසන් දූතයා වශයෙන් එවන ලද මිනිසුන්ගේ සහ ජින්වරුන්ගේ රසූල්වරයා වන මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් ගැන ද එතුමන්ගේ අවසාන නබිත්වය ගැන ද දැන සිටීම සෑම කෙනකුගේ ම යුතුකමකි.

අල්ලාහ්ගේ තේරීමට අනුව නබිවරයා වශයෙන් ද රසූල්වරයා වශයෙන් ද එවන ලද සියල්ලන්ම විශ්වාස කිරීම වැදගත් කරුණකි. ඔවුන්ගෙන් කිසිවෙකු විශ්වාස කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ අපහාස කරමින් කථා කිරීම තහනම් කළ දෙයකි. ඔවුන් සියල්ලන්ම විශ්වාස කළ යුතු බව පහත සඳහන් අල්කුර්ආන් වාක්‍යය පැහැදිලි කරයි.

"(දේව) දූතයා තම පරමාධිපතියාගෙන් තමන්ට පහළ කරන ලද ඒවා විශ්වාස කරයි. (එසේම) මුඃමින්වරුන් ද (විශ්වාස කරති. මොවුන්) සියල්ලෝ ම අල්ලාහ්ව ද ඔහුගේ මලා ඉකාවරුන් ද ඔහුගේ ආගම් ද ඔහුගේ දූතයින් ද විශ්වාස කරති. අප දේව දූතයින්ගෙන් කිසිවෙකු බෙද වෙන්කොට සලකන්නේ නැත (යනුවෙන් ද) තව ද අපි සවන් දුනිමු. (ඔබගේ අණට) අවනත වූයෙමු. අපගේ පරමාධිපතියාණෙනි, ඔබගෙන් ම කමාව අයදිමු. (අපි) ආපසු පැමිණෙන්නේ ද ඔබ ළඟටම ය."

(2 :285)

" අල්ලාහ්ව ද අප මත පහළ කරන ලදදේ (ආගම) ද; ඉබ්රාහීම්, ඉස්මාඊල්, ඉස්හාක්, යඃකූබ් සහ ඔවුන්ගෙන් පැවත එන්නන් මත පහළ කරන ලද ඒවා ද; මූසා, ඊසා සහ සෙසු නබිවරුන්ට ඔවුන්ගේ පරමාධිපතියාගෙන් දෙන ලද ඒවා ද අපි විශ්වාස කරමු. ඔවුන්ගෙන් කිසිවෙකු බෙද වෙන් කොට නොසලකමු ; අපි ඔහුටමය යටත් වන මුස්ලිම්වරු වූයෙමු යැයි (නබිවරයාණෙනි) ඔබ පවසන්න. "

(3 : 84)

මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ අවසාන නබිවරයා වෙති. මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ නබිවරුන්ගෙන් අවසානවන්ත තැනැත්තෝ ය. එතුමාණන්ගෙන් පසුව අලුතින් නබිවරයෙක් නොපැමිණෙන බව මුස්ලිම්වරු ස්ථිරව ම විශ්වාස කරති. එය අල්ලාහ් විසින් ශුද්ධ වූ කුර් ආනයේ මෙසේ තහවුරු කර ඇත.

" مَا كَانَ مُحَمَّدٌ أَبَا أَحَدٍ مِنْ رِجَالِكُمْ وَلَكِنْ رَسُولَ اللهِ وَخَاتَمَ النَّبِيِّينَ وَكَانَ اللهُ بِكُلِّ شَيْءٍ عَلِيمًا "

"මුහම්මද් ඔබගේ කිසිදු පිරිමියෙකුගේ පියා නොවේ ය. එහෙත් ඔහු අල්ලාහ්ගේ දූතයා ද නබිවරුන්ට අවසානවන්තයා වශයෙන් සිටී ද සිටින්නේ ය." (33:40)

මෙසේ පැවසීම මගින් අල්ලාහ් මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්ට ප්‍රදානය කර ඇති ෆුර්කාන් (කුර්ආන්) ආගම පරිපූර්ණ එකක් බවට පත්කර නබිත්වය නිමාවට පත් කර මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් අවසන් නබි වශයෙන් මුද්‍රා තැබුවේ ය. මෙය නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් හිජ්රි 10 වෙනි වර්ෂයේ දී ඉටු කල අවසාන හජ් අවස්ථාවේ දී අල්ලාහ් මෙසේ පැවසී ය.

" الْيَوْمَ أَكْمَلْتُ لَكُمْ دِينَكُمْ وَأَتْمَمْتُ عَلَيْكُمْ نِعْمَتِي وَرَضِيتُ لَكُمُ الْإِسْلَامَ دِينًا "

"අද දින ඔබලා වෙනුවෙන් ඔබලාගේ මාර්ගය (ආගම) සම්පූර්ණ කළෙමි. තව ද ඔබලාට මාගේ දයාව පරිසමාප්ත කළෙමි. තව ද ඔබලා වෙනුවෙන් ඉස්ලාමය මාර්ගයක් වශයෙන් තෝරා ගත්තෙමි." (5:3)

මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ අල්ලාහ්ගේ දූතයා වශයෙන් තෝරනු ලැබ එතුමන්ගේ උම්මතයේ ගැලවීම සඳහා පහළ කරන ලද ශුද්ධ වූ අල්කුර්ආනය නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්ට පෙර පහළ කරන ලද ආගම් සත්‍ය බව ස්ථිර කරති. මෙය අල් කුර්ආනයේ මෙසේ පවසා ඇත.

" තව ද මර්යම් ගේ පුත්‍ර ඊසා ; ඊශ්‍රායිල් ගේ දරුවනි, පෙර තිබූ තෞරාතය සත්‍ය බව ස්ථිර කරමින් ද, මාගෙන් පසුව අහ්මද් නම් නමින් රසූල්වරයෙක් පැමිණෙන බව ශුභ පණිවිඩ පවසන්නෙක් වශයෙන් ද, නියත වශයෙන් ම ඔබලා වෙත (එවන ලද) අල්ලාහ් ගේ දූතයෙක් මි. යනුවෙන් කියා තිබීම (නබිවරයාණෙනි) ඔබ සිහිපත් කරන්න."

(61:6)

මෙම දේව වාක්‍ය මගින් අල්කුර්ආනය නබි ඊසා අලෛහිස්සලාම් තුමා තමන්ට පෙර වූ ආගම වන මූසා අලෛහිස්සලාම් තුමාට පහළ කරන ලද තෞරාතය සත්‍ය බව ස්ථිර කරන අතර තමන්ට පහළ කරන ලද ඉන්ජීලය දන්වා තමන්ගෙන් අනතුරුව පැමිණෙන්නට සිටින දූතයා ගැන ද අනාවැකි පළ කර තිබීම නිරීක්ෂණය කළ හැකි ය.

"මා හටත්, මට පෙර පැමිණි නබිවරුන්ටත් උදහරණය, මිනිසෙකු විසින් තනන නිවසක් වැනි ය. එම මිනිසා එම ගොඩනැගිල්ලේ තැබිය යුතු එක ම ගලක් සඳහා වූ ස්ථානය පමණක් හැර අනෙකුත් තැන් ගල් යොදා බැඳ නිම කරයි. ජනතාව එම ගොඩනැගිල්ල අවට සැරිසර බලා, එම හිඩැසට ගලක් තබා පුරවා නැති බව කියති. එම හිස් තැන පුරවන ගල මම යි. අවසාන නබි වරයා ද මම යි."

(සහීහුල් බුහාරී3342)

මෙසේ නුබුව්වතයේ නිමාව පිළිබඳව පැවසූ නබි තුමාණෝ මෙම අවසාන නබිත්වයට අභියෝග මතු වන බවට ද අනාවැකි පළ කළහ.

"සැබැවින් ම මාගේ සමාජයෙන් බොරුකාරයින් වන දජ්ජාල් වරුන් තිස් දෙනෙක් මතු වෙති. ඔවුහු සැමෝ ම තමන් නබි වරුන් වශයෙන් තර්ක කරති. එහෙත් මමයි අවසාන නබි; මාගෙන් පසුව නබිවරු නොපැමිණෙති."

## අනාවැකි පළ කරන ලද ව්‍යාජ නබිත්ව අභියෝග

මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් විසින් අනාවැකි පළ කරන ලද අවසන් නබිත්වයට එරෙහි අභියෝග එතුමන්ගේ කාලයේදී ම පැණනැගුන බව පෙනී යයි. යෙමන් රාජ්‍යයේ "මුසෙලමා " නැමැත්තා තමන්ට නබිත්වයෙන් කොටසක් ඇති බව ද අල්ලාහ් වෙතින් තමන්ට දේව වැකි ලැබෙන බව ද තර්ක කිරීමට පටන් ගත්තේ ය. මෙම බොරුකාරයා පසුව පළමු කලීෆා අබුබක්ර් සිද්දීක් රළියල්ලාහු අන්හු තුමාගේ පාලන කාලයේ දී "යමාමා" යුද්ධයේ දී මරුමුවට පත් විය. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්ගේ කාලයේදී ම අවසාන නබිත්වයට එරෙහි දෙවැනි අභියෝග ද පැන නැගුණි. මෙම බොරුකාරයා සහාබාවරුන්ගේ කාලයේ දී මැරුම් කෑ අතර දෙවැනි කලීෆා උමර් කත්තාබ් රළියල්ලාහු අන්හු තුමාගේ පාලන කාලයේ දී තෙවැනි ව්‍යාජ නබි අභියෝග පැන නැගුණි. මොවුහු ඉස්ලාමීය ඓතිහාසික තොරතුරුවලින් අනාවරණය වන ව්‍යාජ නබි සඳහා පෙනී සිටි වැදගත් ම තිදෙනා වෙති.

එහෙත් ඉතා දීර්ඝ කාලයකින් පසුව විසිවෙනි සියවස ආරම්භයේ ද ව්‍යාජ නබිත්වයක් හට ගැණුණේය. එහි බලපෑම් අදටත් මුස්ලිම් සමාජයට හිසරදයක් වී ඇත. මෙය වටහා ගෙන අප ඊමානය රැක ගැනීමට උත්සාහ ගනිමු.

### ක්‍රියාකාරකම්

(1). නබිවරුන්, රසූල්වරුන් ඊමාන් කළ යුතු අයුරු අල්කුර්ආනය කෙසේ පවසන්නේ ද?

(2). අවසාන නබිත්වය සුරැකීමට සහභාවරුන්ගේ කාලයේ ගන්නා ලද පියවර පහදන්න.

(3). නබිත්වය නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් සමග නිමාවට පත් වීම විචාර බුද්ධිය අනුව විස්තර කරන්න.